# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2450/41 - 2025 අගෝස්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.21/1978(X)(ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන සහ පීවී 101137 ලියාපදිංචි අංකය දරන, 2021 ජනවාරි 13 වන දින අංක 2210/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියමය මගින් උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පිළිගනු ලබන සහ 2022 දෙසැම්බර් 01 වන දින අංක 2308/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියමය මගින් සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් (ලිමිටඩ්) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එකී නියමය එහි I වන උපලේඛනයේ 2 වන කොන්දේසියේ දැක්වෙන ''මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රවේශ සුදුසුකම්'' යන වචන වෙනුවට පහත සඳහන් දෑ ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

> ''මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රවේශ සුදුසුකම් සහ 2015.05.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකී උපාධි පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතුය.''

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0233/1

1A - PG 7231 - 284 (2025/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්.ඩී.බී.21/1978(X)(ඈ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක්වන සහ පීවී 101137 ලියාපදිංචි අංකය දරන, 2020 ජනවාරි 06 වන දින අංක 2157/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියමය මගින් උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා මෙකාට්‍රොනික් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පිළිගනු ලබන සහ 2022 දෙසැම්බර් 01 වන දින අංක 2308/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියමය මගින් සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් (ලිමිටඩ්) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එකී නියමය එහි I වන උපලේඛනයේ 1 වන කොන්දේසියේ (ii) ඡේදයේ දැක්වෙන ''මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රවේශ සුදුසුකම්'' යන වචන වෙනුවට පහත සඳහන් දෑ ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

> ''මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රවේශ සුදුසුකම් සහ 2015.05.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකී උපාධි පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු, මෙකාට්‍රොනික් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතුය.''

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0233/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.